**කාත්තාන්කුඩි නගර සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 08 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කාත්තාන්කුඩි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතයසඳහා පදනම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. නිදසුන් වශයෙන් කුලී ආදායම් හා තොග. | තොග ගණනය කිරීමේදී ශුද්ධ උපලබ්ධි අගයට ඉදිරිපත් කළ යුතුය. | පිළිගෙන තිබුණි. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නගර සභා බල ප්‍රදේශයේ පවතින කොට්ඨාශ 12 හි 2015 වර්ෂයේදී වරිපනම් බදු තක්සේරු කර තිබුණත්, දේපල වටිනාකම තක්සේරුවට අදාලව තක්සේරු දෙපාර්තමේන්තුවට | තක්සේරු කිරීම නියමිත කාලපරිච්ඡේදය තුළ පවත්වා තක්සේරු දෙපාර්තමේන්තුවට යැවිය යුතු වීම. | පිළිගෙන තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | හැඳින්වීමක් සිදු නොකිරීම හේතුවෙන් දේපල තක්සේරු කිරීම විධිමත් ආකාරයෙන් සිදුකර නොතිබුණි. | | |
| (ආ) | නගර සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පළාත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවෙන් දේපල අයිතිය මාරු කිරීම, දැවැදි සහ පරිත්‍යාග මත අයකළ යුතු මුද්දර ගාස්තු නිවැරදිව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මුද්දර ගාස්තු නිවැරදිව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඉදිරිපත් කළ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ඇ) | නගර සභාවට අයත් මෝටර් රථ වාහන සහ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දී තිබූ මෝටර් රථ හා වාහන සභාව විසින් භාවිතා කරනු ලබමින් පැවැතුණි. මෙයින් සභාවට අයත් මෝටර් රථ හා වාහනවල වටිනාකම වර්ෂ 05 කට අධික කාලයක සිට තක්සේරු නොකර හෝ නැවත තක්සේරු නොකර ගිණුම්වල එකතුව රු.27,145,214 ක් දක්වා තිබුණි. | සෑම වර්ෂයකම සභාවට අයත් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් මෝටර් රථවල වටිනාකම නැවත තක්සේරු කර ගිණුම්වල ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගෙන ඇත. |

### 1.3.3 අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා බාහිර පාර්ශවයන්ට එරෙහිව නඩු 05 ක් පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රතිපාදන කිසිවක් අසම්භාව්‍ය බැරකම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සභාව විසින් පවරා තිබූ නඩු සම්බන්ධයෙන් විලම්භිත බැරකම් ගිණුම්වල දැක්විය යුතුවීම. | පිළිගෙන ඇත. |

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

**(අ) ලැබිය යුතු ගිණුම්**

---------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනවල හිඟහිටව පවතින විදුලිබල මණ්ඩල අත්තිකාරම් රු.2,399,352 ක් අඛණ්ඩව වර්ෂ 10 කට අධික කාලයක සිට ගිණුම්වල ඉදිරිපත් කර තිබුණි. එසේ වුවත්, ඒ පිළිබඳ ලේඛන, පොත්පත් සහ සනාථ කළ හැකි සාක්ෂි ආදි කිසිවකින් තොරව ගිණුම්වල ඉදිරිපත් කර තිබුණද, හිඟ මුදල් අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 1986 වර්ෂයේ සිට ඉදිරිපත් කර තිබූ අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ii) | විශ්‍රාම ගිය, සේවය හැර ගිය, මියගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයකර ගත යුතු හිඟ ණය ශේෂ රු.39,276 ක් පාරිතෝෂිතයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විශ්‍රාම ගිය නිලධාරියාගෙන් හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිගෙන ඇත. |

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

-------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ජංගම බැරකම් වශයෙන් දක්වා ඇති රු.6,642,879 ක ණය හිමියන් වර්ෂ කිහිපයක සිට හඳුනා නොගෙන නිරවුල් කිරීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 1986 වර්ෂයේ සිට ගෙවිය යුතුව පැවති රු.6,642,879 ක් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | පිළිගෙන තිබුණි. |

**1.3.5 ලේඛනගත සාක්ෂි නොවීම**

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියේ ඉදිරිපත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම රු. | සාක්ෂි නොවීම | නිර්දේශ | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| විදුලි ගබඩා උපකරණ තොග | 2,639,987 | තොග ලේඛන | විදුලි උපකරණ තොග, තොග ලේඛනයේ සටහන් කළ යුතු වීම. | පිළිගෙන ඇත. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනත (255 වගන්තිය) | නීතිවිරෝධී ආකාරයෙන් අනුමැතියකින් තොරව ඉදිකළ ගොඩනැගිලි හඳුනාගෙන ඒවාට විරුද්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නීති විරෝධී ගොඩනැගිලි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. | පිළිගෙන ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | විවිධ අත්තිකාරම් 32 ක් එකතුව රු.3,309,693 ක් විවිධ පුද්ගලයන්ට 2011 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ලබා දී තිබූ අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි. | නිරවුල් නොකර පවතින අත්තිකාරම් විධිමත් අයුරින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. | පිළි ගනිමි. |
| | | සභාව විසින් ලබා දී තිබූ එකතුව රු.3,855,339 ක විවිධ අත්තිකාරම් 33 ක් දිගු කාලයක් නිරවුල් නොකර සමාලෝචිත වර්ෂය අවසාන කාලපරිච්ඡේදය වන විටත් පැවතුණි. ඉන් රු.245,645 | අත්තිකාරම් ගෙවීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතු වීම. | පිළිගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | ක් හඳුනා නොගත් ලෙස දක්වා තිබුණි. | | |
| (ii) | මුදල් රෙගුලාසි 571 | එකතුව රු.2,408,199.57 ක් වටිනා කල් ඉකුත් වූ විවිධ ඉකුත් තැන්පතු 17 ක් සම්බන්ධයෙන් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2014 වර්ෂයේ සිට පැවත එන කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>----------------------------<br>2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ IV වගන්තිය | සේවකයන් පැමිණීමේ හා පිටවී යාමේ ඇඟිලි සලකුණු පදනම් කරගනිමින් අමතර කාලයක් සහ රජයේ නිවාඩු දින වැටුප් ලබාදිය යුතුය. එසේ වුවත්, මෙය සැලකිල්ලට නොගෙන රු.32,648 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | | |

## 1.4.2 බදු අවශ්‍යතාවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ 2002 වර්ෂයේ අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 20 වැනි වගන්තිය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 මාර්ගෝපදේශයේ සඳහන් කර ඇති ආකාරයට එක් සැපයුම්කරුවෙක් හෝ කොන්ත්‍රාත්කරුවෙක් එකතු කළ අගය මත බදු ඉල්ලීම් කිරීමේදී මෙන්ම ඔහු විසින් "වැට් ඉන්වොයිසිය" (VAT Invoice) ඉදිරිපත් කිරීමේදී ඔහුට එකතු කළ අගය මත බදු ගෙවිය හැකිය. සමාලෝචිත වර්ෂයේදී මිලදී ගනු ලැබූ භාණ්ඩවලින් විවිධ සැපයුම්කරුවන් වෙත එකතු කළ අගය මත බදු වශයෙන් ගෙවීම් කර තිබුණත් එම සැපයුම්කරුවන්ගෙන් "වැට් ඉන්වොයිසිය" | වැට් ඉන්වොයිසියි සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කිරීමේදී ඔහුට එකතු කළ අගය මත බදු ගෙවිය හැකිය. | පිළිගෙන තිබුණි. |

(VAT Invoice) ලැබී නොතිබුණි. එසේම ගෙවා තිබූ එකතු කළ අගය මත බදු පිළිබඳව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හා විගණකාධිපතිට දැනුම් දී නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,689,496 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,504,832 ක්වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,184,664 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ හා ඇස්තමේන්තු කළ ආදායම්, ලැයිස්තුගත කළ ආදායම්, රැස්කළ ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2018 ඇස්තමේන්තුගත ආදායම් | 2018 ලැයිස්තුගත කළ ආදායම් | 2018 අයකළ ආදායම් | 2018 දෙසැම්බර් 31 දිනට හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම් | 2017 ලැයිස්තුගත කළ ආදායම් | 2017 අයකළ ආදායම් | 2017 දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 18,409,850 | 18,359,223 | 14,662,263 | 3,696,960 | 18,522,000 | 17,404,255 | 13,072,336 | 4,331,919 |
| (ii) | කුලී | 7,501,500 | 5,562,342 | 5,662,342 | - | 5,882,500 | 5,511,740 | 5,511,740 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,060,000 | 3,110,940 | 3,090,140 | 20,800 | 2,560,00 | 2,989,600 | 2,970,100 | 19,500 |
| (iv) | අනෙකුත් ආදායම් | 26,389,500 | 25,487,741 | 25,487,741 | - | 24,414,200 | 14,387,750 | 14,387,750 | - |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු (ආදායම් සංකේතය 10311 A) රු.8,461,187 කින් සමාලෝචිත වර්ෂයේ රු.4,452,695 ක වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බිල්කළ වරිපනම් බදු (ආදායම් සංකේතය 10311) රු.16,929,108 කින් සමාලෝචිත වර්ෂ අවසාන වන විට රු.3,696,960 ක වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂ අවසානයට අයකළ යුතු වෙළඳ බදු රු.19,500 ක් වශයෙන් වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වෙළඳ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිගෙන ඇත. |

### 2.2.3 JCB යන්ත්‍රය භාවිතය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නගර සභාව විසින් මෙම යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව 2013 ඔක්තෝබර් 10 දින සභාව විසින් දේශීය සංවර්ධන අරමුදල යටතේ ණය ගැනීම මඟින් JCB යන්ත්‍රය මිලදී ගැනීමට තීරණය කර තිබුණි. ඒ අනුව, ණය අරමුදල මඟින් රු.11,900,000 ක වටිනාකමට හා සභාවේ ආදායම් ඉහළ නංවා ගැනීමේ අරමුණෙන් මෙම යන්ත්‍රය මිලදී ගෙන තිබුණි. එසේ වුවත්, සභාව විසින් මෙම යන්ත්‍රය භාවිතා කිරීම මඟින් පාඩු ලබා තිබුණි. | JCB යන්ත්‍රය මඟින් සමාගමට පාඩු නොවන ආකාරයට භාවිතා කළ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ආ) | නගර සභාවට ආදායම් ඉපැයීමේ JCB යන්ත්‍ර 02 ක් මඟින් සභාවේ කාර්යයන් මෙන්ම පාසැල්, ආගමික ස්ථාන, මහජන ආයතන සහ රජයේ දෙපාර්තමේන්තු සඳහා යන්ත්‍ර පැය 832.7 ක් මෙම සේවාව නොමිලයේ ලබා දී තිබුණි. එසේ උපයෝජනය කළ පැයක් සඳහා JCB යන්ත්‍රයේ ධාවන සටහන් (Running Chart) අදාළ නිලධාරීන් විසින් අත්සන් නොතැබීමෙන් මේවා භාවිතා කළ අරමුණ තහවුරු කරගත නොහැකි වී | මහජන ආයතන සඳහා JCB යන්ත්‍රය භාවිතා කිරීමේදී අදාළ නිලධාරීන් විසින් ධාවන සටහන් (Running Chart) තහවුරු කළ යුතු වීම. | පිළිගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. මේ නිසා සභාවට ආදායම් අහිමි වීම් රු.2,498,100 ක් වී තිබුණි. | | |
| (ඇ) | නගර සභාව සමාලෝචිත වර්ෂයේ මෙම යන්ත්‍ර, යන්ත්‍ර පැය 969.2 ක් උපයෝජනය කර තිබුණි. මේ අනුව, ඉන්ධන, යන්ත්‍ර අලුත්වැඩියා, රියදුරු වැටුප් සහ යන්ත්‍රයේ ණය ආපසු ගෙවීම් ඇතුළත්ව රු.1,880,690 ක් වැය කර තිබුණි. සභාවේ කාර්යයන් හැර අනෙකුත් කාර්යයන් සඳහා මෙම යන්ත්‍රය, යන්ත්‍ර පැය 136.5 ක් උපයෝජනය කර තිබූ බැවින් රු.409,500 ක් පමණක් උපයා ගෙන තිබුණි. මෙම ක්‍රියාවලිය පරීක්ෂා කළහොත් වාර්ෂිකව සභාව විසින් රු.1,471,190 ක් ආසන්න වශයෙන් අහිමි විය හැකිව තිබුණි. | JCB යන්ත්‍රයේ භාවිතය, ඒවා නඩත්තු කිරීමේ වියදම් මඟින් සලසා ගත යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ඇ) | සභාවේ අවසරයක් නොමැතිව සමාලෝචිත වර්ෂයේ මෙම යන්ත්‍රය පුද්ගලික කාර්යයන් සඳහා යන්ත්‍ර පැය 136.5 ක් භාවිතා කර තිබුණි. එසේ වුවත්, ඒ සඳහා ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුද්ගලික කාර්යයන් සඳහා JCB යන්ත්‍රය භාවිතා කිරීම පිළිබඳව සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතු වීම. | පිළිගෙන ඇත. |

**2.3.4 උසාවි දඩ ගාස්තු සහ මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම නිලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දින වන විට රු.6,052,504 ක් මුද්දර ගාස්තු ලැබිය යුතුව පැවතුණු අතර හිඟහිටි උසාවි දඩ ගාස්තු වටිනාකම ගණනය කර ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාවට ලැබිය යුතු උසාවි දඩ ගාස්තු ගණනය කර භාණ්ඩාගාරයෙන් ලබාගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. | පිළිගෙන ඇත. |

**(අ) මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභා බල ප්‍රදේශයේ 2017 සහ 2018 කාලපරිච්ඡේදයේ ගිණුම්වල ඉඩම් පැවරුම් කිරීම මත මුද්දර ගාස්තු මඩකලපුව සහ කල්මුනේ පිහිටි දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් රැස්කර නැගෙනහිර පළාත් භාණ්ඩාගාර ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවා තිබූ මුද්දර ගාස්තු පළාත් සභා ලබාගැනීම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර භාණ්ඩාගාරයෙන් ලබාගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වීම. | පිළිගෙන ඇත. |
| (i) නැගෙනහිර පළාත් සභාවේ 2010 වර්ෂයේ අංක 06 දරන මුද්දර ගාස්තු සංශෝධිත 03 වගන්තිය ප්‍රකාරව, වාර්ෂිකව මුද්දර ගාස්තු අයකළ යුතුය. එසේ වුවත්, 2018 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළ මුද්දර ගාස්තු නගර සභාව විසින් ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් නියමිත කාලය තුළදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර භාණ්ඩාගාරයෙන් ලබාගැනීමට ක්‍රියා කළ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ii) නැගෙනහිර පළාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නැගෙනහිර පළාත් සභා 2008 අංක 01 දරන බදු හා ගාස්තු පැනවීමේ හා රැස්කිරීමේ මූලාය පාලන පනතේ 37 වැනි වගන්තිය ප්‍රකාර නගර සභා බල ප්‍රදේශයේ පිහිටි නිශ්වල දේපල පැවරීමේදී නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් 2016, 2017 හා 2018 දෙසැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය සඳහා සෘජුවම හා ජංගම සේවාවන් මඟින් අයකළ අමතර මුද්දර ගාස්තු සම්බන්ධයෙන් දේපල හිමිකරුවන් විසින් නැගෙනහිර පළාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා තිබූ මුද්දර ගාස්තු ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර භාණ්ඩාගාරයෙන් ලබාගැනීමට ක්‍රියා කළ යුතු වීම. | පිළිගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (iii) | මුද්දර ගාස්තු, නගර සභාවට ලැබිය යුතු ආදායමකි. එසේ වුවත්, 2018 කාලපරිච්ඡේදයේ නැගෙනහිර පළාත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අමතරව අයකරන ලද මුද්දර ගාස්තු ගණනය කර විගණන දිනය වන 2019 මාර්තු 28 දින වන විටත් නගර සභාවට ලැබී නොතිබුණි. මේ නිසා, අමතර මුද්දර ගාස්තු සහ ඉඩම් විකුණුම් ගාස්තු ආදායම් වාර්ෂිකව නොලැබී අහිමි වෙමින් පැවතුණි. | සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර භාණ්ඩාගාරයෙන් ලබාගැනීමට ක්‍රියා කළ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (iv) | නගර සභාව විසින් ගණනය කර 2017 සහ 2018 ජුනි මාසය දක්වා කාලපරිච්ඡේදයේ හුවමාරු කළ දැවැදි සහ පරිත්‍යාග මඟින් අයිතිය පවරනු ලැබූ නිශ්චල දේපල මත මුද්දර ගාස්තු ආදායම් ලෙස නැගෙනහිර පළාත් භාණ්ඩාගාරයෙන් පරිපාලන වියදම් සඳහා අයකරනු ලැබූ 1%ක ප්‍රතිශතය පළාත් සහකාර ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්ට ගෙවූ මුදල ගණනය කර ගෙවූ බවට සමාලෝචිත වර්ෂය සඳහා වූ ගිණුම්වල දක්වා නොතිබුණි. | සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර භාණ්ඩාගාරයෙන් ලබාගැනීමට ක්‍රියා කළ යුතු වීම. | පිළිගෙන ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

නගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුබසාධනය යන කාර්යයන් සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ 255 අධිකාරය ප්‍රකාරව, නගර සභාවේ ආදායම් සහ විධිමත් කිරීම යන වැදගත් කරුණු පිළිබඳ අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. එසේ වුවත්, නගර සභාව විසින් අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් වූ ඉල්ලීම් නැගෙනහිර පළාත් පාලන | නගර සභා ආඥා පනතේ 255 වැනි අධිකාරිය ප්‍රකාරව, උප රීතීන් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. | ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගනිමින් පවතී. |

අමාත්‍යවරයාගේ එකඟතාවයකින් තොරව 2014 වර්ෂයේදී යවා තිබුණි. නමුත් 2018 දෙසැම්බර් 31 වන විටත් ඒ සඳහා අනුමැතිය ලබා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) අරමුණුවලට පටහැනි කාර්යයන්

| | | |
|---|---|---|
| කාත්තාන්කුඩි නගර සභාව යටතේ ක්‍රියාත්මක වන මඩුව අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ජීව වායු නිෂ්පාදනය කිරීම සඳහා 2012 වර්ෂයේදී රු.10,446,427 ක් ඇස්තමේන්තු කර උක්ත ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා ශාමිල් කොන්ත්‍රාත් ආයතනය සමඟ රු.8,580,000 කට ගිවිසුම් ගත වී තිබුණි. 2015 කාලපරිච්ඡේදය දක්වා එකතුව රු.8,151,000 ක් ගෙවීම් සිදුකර තිබුණි. මෙම ව්‍යාපෘතිය විධිමත්ව ක්‍රියාත්මක කර ඉන් පිටවන ජීව වායු ව්‍යාපෘති යෝජනාවේ සඳහන් ආකාරයට මහජනතාවට බෙදානොහැර විවෘත ප්‍රදේශයක බැහැර කිරීම ඝාතකාගාර කටයුතු 2018 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ, උපලේඛනය (අ) හි සඳහන් කර තිබුණි. තවද, 1988 වර්ෂයේ අංක 56 දරන පනත ප්‍රකාරවත් සහ 2000 වර්ෂයේ අංක 53 දරන පනත මඟින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත ප්‍රකාර පරිසර ආරක්ෂා කිරීමේ අනුමැතියකින් තොරව සත්ව ඝාතකාගාරය පවත්වාගෙන යාම දඩුවම් ලැබිය හැකි වරදක් බව මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලිඛිතව දන්වා තිබුණි. ඉහත සඳහන් කරුණු අනුව අදාළ ව්‍යාපෘතිය විධිමත්ව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් කාත්තාන්කුඩි නගර සභා බල ප්‍රදේශයේ සත්ව ඝාතකාගාරය පවත්වාගෙන යාම පරිසරයට හානිදායක බැවින් එහි වෙසෙන ජනතාවට ද ගැටළුවලට මුහුණපෑමට සිදුවිය හැකි බව මෙයින් නිරීක්ෂණය වේ. | මඩුව අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක ජීව වායු නිෂ්පාදනය කර ඒවා මහජන උපයෝජනය සඳහා ලබාදිය යුතුය. | සඳහන් කරන ලද වැඩසටහනේ සම්පූර්ණ ප්‍රයෝජන තව වර්ෂ දෙකකින් නිමවීමට නියමිතය. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ දීර්ඝ කාලීන සහ කෙටිකාලීන වැඩසටහන් සඳහා සමාලෝචිත වර්ෂයේ රු.5,847,951 ක් වැය කර තිබුණි. එසේ වුවත්, සභාවේ ආදායම් වශයෙන් රු.2,119,608 ක් ලැබී තිබුණි. මෙම ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණ** | **නිර්දේශ** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | ----------------------- | ----------- | ------------------------- |
| (i) | සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් වැඩසටහන් සකස් කර ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් සභාව විසින් රියැදුරන්, කසල එකතු කිරීම සඳහා අවශ්‍ය වාහන, සෞඛ්‍ය කම්කරුවන් ආදිය වැඩිකිරීම සහ ගම්මානවල පරිසරය සුරැකීමේ කමිටු ස්ථාපිත කර ඒ මඟින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සංවර්ධනය කිරීමේ ක්‍රියාමාර්ග මේ දක්වා ගෙන නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වැඩසටහන් සකස් කළ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ii) | සභා බල ප්‍රදේශයේ පිහිටි නිවාස, ආයතන, කඩ කාමර සහ පොදු ස්ථානවල කසල වෙන්කර එකතු කිරීමේ කාර්යය ජනතාවගේ උදාසීන බව සහ නොසැලකිල්ල නිසා සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මකව පැවතුණි. මේ හේතුවෙන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය මඟින් සභාව විසින් කාබනික පොහොර නිෂ්පාදනය සහ ප්‍රතිචක්‍රීයකරණ විකුණුම් වැනි වැඩසටහන් පමණක් ක්‍රියාත්මක කරනු ලැබේ. එසේ වුවත්, මේ හැර වෙනත් ක්‍රමෝපායවලින් ආදායම් ඉපැයීම සඳහා වූ වැඩසටහන් සැලසුම් කර නොතිබුණි. | ආදායම් උපදවීමේ ක්‍රමෝපායයන් සැලසුම් කළ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (iii) | කාත්තාන්කුඩි නගර සභාව විසින් එකතු කළ ඝන අපද්‍රව්‍ය Load 336 ක්, ඝන අපද්‍රව්‍ය එක් රැස්කිරීමේ මධ්‍යස්ථානයේ සිට "කොඩුවාමඩු" වලට ප්‍රවාහනය සඳහා කුලියට ලබාගත් ටිපර් රථ සඳහා රු.1,785,000 ක | ඝන අපද්‍රව්‍ය, ඝන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානයට ප්‍රවාහනය සඳහා අවශ්‍ය වාහන කුලියට ගැනීම ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කරමින් සිදු කළ යුතු වීම. | පිළිගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම් සිදුකර තිබුණි. මේ වෙනුවෙන් ලංසු කැඳවීමේදී, වෙළඳපොලේ Load 01 ක් සඳහා රු.4,500 ක මිලකට පුද්ගලයින් තිදෙනෙකු ටිපර් රථ කුලියට දීමට ඉදිරිපත් වී සිටි නමුත්, ඒ පිළිබඳව අවධානය යොමු නොකර Load 283 ක් සඳහා රු.5,500 බැගින් රු.1,556,500 ක් ගෙවීම් සිදු කිරීම නිසා සභාවට රු.283,000 ක අමතර වියදමක් දැරීමට සිදු වී තිබුණි. | | |
| (iv) | කාත්තාන්කුඩි නගර සභාව විසින් 2015 වර්ෂයේ සිට 2019 මාර්තු 07 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා කාබනික පොහොර නිෂ්පාදනය, විකිණීමේ ඒකක පරීක්ෂා කිරීමේදී, කාබනික පොහොර 3,275 kg ක හිඟයක් නිරීක්ෂණය විය. | කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳව විධිමත් ලේඛනගත කිරීම් සිදුකළ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (ඈ) | තිරසාර සංවර්ධන අරමුණු<br>------------------------------- | | |
| | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2015 වර්ෂයේ තිරසාර සංවර්ධන සම්මේලනයේ තීරණයට අනුව කාර්යයන් ක්‍රියාත්මක කිරීම. | උක්ත සඳහන් කරනු ලැබූ කරුණු පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් නොමැති වීම නිසා තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් |
| (ඉ) | LGIP ණය වැඩසටහන යටතේ නගර සභා බල ප්‍රදේශයේ පවතින මාර්ග සහ කානු පද්ධති සංවර්ධනය කිරීමේ අරමුණින් සියයට 09 ක වාර්ෂික පොලියක් මත වර්ෂ 10 කින් ආපසු ගෙවීමේ පදනම මත රු.7,317,456 ක ණය ලබා සමාලෝචිත වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පොලී ගෙවිය යුතුව තිබුණත් මෙම මාර්ග විධිමත් අයුරින් සම්පූර්ණ කර නඩත්තු නොකර පැවතුණි. | LGIP ණය වැඩසටහන යටතේ ඉදිකිරීමට තීරණය කළ මාර්ග විධිමත්ව ඉටු කළ යුතු විය. | ඇතැම් මාර්ග ප්‍රතිසංස්කරණය කර ඇත. අනෙකුත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පියවර ගනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2018 වර්ෂය සඳහා වූ කොන්ත්‍රාත් කාර්යයන් පිළිබඳ විගණනය සිදුකිරීමේදී 2017 වර්ෂයේදී නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන සලසා රු.12,251,670 ක වටිනාකමට SMA Careem Construction (Pvt) Ltd යන අය සමඟ Concrete Drain with cover slab at mosque road Kaththankudy කාර්යය නිම කිරීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹ තිබුණි. ඉන් මීටර් 450 ක් පමණ ඉදිකිරීම් සම්පූර්ණ කර හා තවත් මීටර් 300 ක කාර්යයන් නිම නොවී ද පැවැති බව දක්නට ලැබුණි. ඉටු කළ කාර්යය සඳහා රු.9,406,271 ක තොගයක් 2017 දෙසැම්බර් 29 දින ගෙවීම් කර තිබුණත්, ඉන් අනතුරුව අවසන් කළ යුතු අනෙකුත් කාර්යයන් මේ දක්වා ඉටු කර නොතිබුණි. මේ හේතුවෙන් මහජනතාව මහත් දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින් සිටිති. පසුව 2018 වර්ෂයේදී ද දෙවරක් කාලය දීර්ඝ කිරීම් කර දී තිබුණත් 2019 මාර්තු 12 දින වන විටත් කිසිඳු කාර්යයක් ආරම්භ කර නොතිබුණි. තවද, බාධකයක්ව පවතින විදුලි කණු ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉවත් නොකිරීමද ඉදිකිරීම් කාර්යයන් ප්‍රමාද වීමට එක් හේතුවක් වී තිබූ බව නිරීක්ෂණය විය. | 2017 වර්ෂයේදී නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය හරහා සලසාගෙන තිබූ ප්‍රතිපාදන මඟින් ඉදිකළ මාර්ගය ගිවිසුම් සඳහන් කාල සීමාව තුළ නිම කර නොතිබුණි. | පිළිගෙන ඇත. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| විගණන නිරීක්ෂණ<br>---------------------- | නිර්දේශ<br>----------- | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම<br>-------------------------- |
|---|---|---|
| **කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගැනීම**<br>-----------------------------------<br>අනුමත සේවක සංඛ්‍යාව ඒ වන විටත් නිලධාරීන් 39 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණද, අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන | අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් පසුව | පිළිගෙන ඇත. |

| | | |
|---|---|---|
| චක්‍රලේඛය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය සහ මෙයට අදාල ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා වන අනුමැතීන් ලබා නොගෙන නැගෙනහිර පළාත් සභා කොමසාරිස්වරයාගේ අනුමැතිය සහිතව සභාවේ ඉල්ලීම පදනම් කරගනිමින් සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 39 දෙනෙකු සභාව විසින් පත්කර ගෙන තිබුණි. මේ නිසා සභාවට සමාලෝචිත වර්ෂයේදී රු.11,000,361 ක වියදමක් අමතරව ඇති වී තිබුණි. එසේ වුවත්, එම සේවකයින් පත් කළ තනතුරුවලට අනුයුක්ත කර නොතිබුණි. | සේවකයින් බඳවා ගත යුතු වීම. | |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු දේපල බදු දීමේදී බදු ගිවිසුමේ ඇප ලේඛන ලබාගත යුතු බවට සඳහන්ව තිබුණත් එවැනි ඇප ලේඛන හෝ ඇප මුදල් ලැබී නොතිබුණි. මේ නිසා බද්දට වත්කම් ලැබූ අය, බදු මුදල් ගෙවීම පැහැර හැරි විටෙක, සභාවට ආදායම් අහිමි විය හැකිය. | සභාව සතු දේපල බදු දීමේදී බදු ගිවිසුම් ඇප ලේඛන ආදිය ලබාගත යුතුවීම. | පිළිගෙන ඇත. |

### (ආ) පාඩු හා හානි අයකර ගැනීම

සභාවේ ගණකාධිකාරී විසින් සමාලෝචිත වර්ෂයේ රැස්කළ මුදලින්, මුදල් අංශයේ රු.49,425 ක් නැතිවීම සම්බන්ධයෙන් සභාව විසින් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.4 පාර්ලිමේන්තුවේ ගිණුම්කාරක සභා කමිටු වාර්තා

කාත්තාන්කුඩි නගර සභාවේ 2017 වර්ෂයේ පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා කමිටු වාර්තාවෙන් අනාවරණය කරනු ලැබූ කරුණු සම්බන්ධයෙන් මේ දක්වා පියවර ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(අ) කින්නියා සහ ත්‍රිකුණාමලය අතර මඟීන් ප්‍රවාහනය සඳහා භාවිතා කරනු ලැබූ බෝට්ටුව කාත්තාන්කුඩි කොක්කඩිච්චෝලෙයි සඳහා ප්‍රවාහන කටයුතු සඳහා යොදවා ගැනීමට රු.323,550 ක් වැයකර කාත්තාන්කුඩිය වෙත ගෙනැවිත් තිබුණි. කාත්තාන්කුඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

විසින් මෙම බෝට්ටුව අලුත්වැඩියාව සඳහා රු.489,500 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, එය මේ දක්වා භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) 1995 සිට 2013 දක්වා පළාත් සභා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ගෙවිය යුතු වූ මාසික දායකය රු.2,375,058 ක් මේ දක්වා ගෙවා නිරවුල් කර නොතිබුණි.

(ඇ) **ප්‍රමාණවත් අධිකාරී බලය නොමැති ගනුදෙනු**

**---------------------------------------------------**

1992 වර්ෂයේ කාත්තාන්කුඩි නගර සභාවට පරිත්‍යාග කරනු ලැබූ රු.600,000 ක් වටිනා රෝද හතරේ ට්‍රැක්ටරයක් 2014 දෙසැම්බර් 31 දින වන විටත් භාවිතා කර නොතිබුණි. මෙම යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා 2012 වර්ෂයේදී එකතුව රු.315,203 ක් සභාව විසින් වැය කර තිබුණි. කෙසේ වෙතත්, 2015 මැයි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය අනාවරණය කර තිබූ කොන්දේසි සැලකිල්ලට නොගෙන සභාවේ ලේකම්වරයා විසින් රු.16,150 ක මුදලකට මෙය වෙන්දේසියේ විකුණා තිබුණි.

(ඈ) **කොන්ත්‍රාත් පදනම මත සේවකයන් පත්කිරීම**

**--------------------------------------------------------**

අනුමත සේවක සංඛ්‍යාවට වඩා නිලධාරීන් 25 දෙනෙකුගේ අතිරික්තයක් ඒ වන විටත් පැවැතියද අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය සහ මේ සම්බන්ධ මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීමේ අනුමැතිය ලබා නොගෙන ද නැගෙනහිර පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ ඉල්ලීම පදනම් කරගනිමින් 2015, 2016 සහ 2017 වර්ෂවලදී කොන්ත්‍රාත් පදනමින් සේවකයින් 77 දෙනෙකු සභාව විසින් පත් කර තිබුණි.

තවද, සභාව විසින් නඩත්තු කළ පුස්තකාල 02 ක් සහ කියවීම් ශාලා 04 ක් සඳහා අනුමත කළ සේවක සංඛ්‍යාව 09 දෙනෙකු වුවත්, එම පුස්තකාල සහ කියවීම් ශාලා සඳහා අනියම් සේවකයින් 11 දෙනෙකු ඇතුළුව සේවකයින් 23 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඉ) **රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකත්ව මුදල් ප්‍රේෂණය නොකිරීම**

**--------------------------------------------------------------------------**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 පෙබරවාරි 24 දිනැති අංක 2/2011 දරන චක්‍රලේඛය ප්‍රකාරව, අනියම් හා තාවකාලික සේවකයින්ගේ දායක මුදල් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කළ යුතුයි. කෙසේ වෙතත්, 2015, 2016 සහ 2017 වර්ෂවලදී පත්වීම් ලැබූ සේවකයින් 77 දෙනෙකු වෙනුවෙන් වූ දායක මුදල් ඔවුන්ගේ වැටුපෙන් අඩුකර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඊ) **පුස්තකාල ගොඩනැගිල්ල කුලියට දීම**

**--------------------------------------------**

තක්සේරු දෙපාර්තමේන්තුව පුස්තකාල ගොඩනැගිල්ලේ මාසික කුලිය රු.125,000 ක් තක්සේරු කර තිබුණු නමුත් 2014 වර්ෂයේදී, වර්ෂ 04 ක කාලපරිච්ඡේදයක් සඳහා රු.5,000 ක මාසික කුලියක් මත පුද්ගලික අධ්‍යාපන ආයතනයකට මෙම ගොඩනැගිල්ල සභාව විසින් කුලියට ලබා දී තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සභාව විසින් රු.4,755,000 ක කුලියක් අහිමි කර තිබුණි.

## 3.5 වාහන මිලදී ගැනීම

-----------------------

සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් රු.4,550,000 ක් වටිනා ලොරි රථයක්, රු.1,240,000 ක් වටිනා ට්‍රැක්ටරයක් මිලදී ගෙන තිබුණත් එම මිලදී ගැනීම්වලදී රජයේ මුදල් රෙගුලාසි 41(2), 2016 මාර්තු 17 දිනැති අංක 1/2016 දරන මුදල් අමාත්‍යාංශයේ අයවැය චක්‍රලේඛයේ 5.1 වගන්තිය, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශයට ප්‍රකාර ප්‍රසම්පාදන කාලසටහන, නැගෙනහිර පළාත් සැප්තැම්බර් 21 දිනැති අංක 07/04/2017 දරන පළාත් චක්‍රලේඛයේ 7.1 ඡේදය සහ 5.3.13 (අ) මාර්ගෝපදේශය යනාදිය අනුගමනය කර නොතිබුණි.

## 3.6 වාර්ෂික භාණ්ඩ /තොග සමීක්ෂණය

-------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ/තොග සමීක්ෂණය සභාව විසින් පත්කරනු ලැබූ නිලධාරීන් තිදෙනෙකුගෙන් යුත් සමීක්ෂණ මණ්ඩලයක් විසින් 2019 පළමු කාර්තුවේ සිදුකරනු ලැබූ අතර මේ සඳහා රු.6,000 ක ගෙවීම්ද සිදුකර තිබුණි. මෙම සමීක්ෂණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වාර්ෂික භාණ්ඩ තොග සමීක්ෂණය සිදුකිරීම සඳහා පත්කරනු ලැබූ නිලධාරීන් භාණ්ඩවල තථ්‍ය පැවැත්ම තහවුරු කිරීම සඳහා තොග ලේඛනය සමඟ සසඳා ගණනය කළ බවට හෙළිදරව් කිරීමක් ලෙස තොග ලේඛනයේ සලකුණු කර, තහවුරු කර අත්සන් යොදා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ තොග සමීක්ෂණය 2018 දෙසැම්බර් 31 දින පදනම් කරගෙන සිදු කළ යුතුය. තවද මෙම දිනට පසුව සිදුවන ලැබීම් සහ නිකුත් කිරීම් සම්බන්ධයෙන් ගැලපීම් සිදුකර අවසන් තොගය ගණනය කළ යුතු වුවත් මෙම ගණනය කිරීම් කෙරෙහි අවධානය යොමු නොකර තොග සමීක්ෂණය සිදුකර තිබුණි.

(ඇ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් තහවුරු කර පොදු ආකෘතියේ “S” සලකුණු කර අනාවරණය කර තිබූ භාණ්ඩ විගණන දිනය වන 2019 අප්‍රේල් 30 දින පරීක්ෂා කිරීමේදී මෙලෙස සලකුණු කළ භාණ්ඩවල සංඛ්‍යාත්මකව වෙනසක් දක්නට ලැබුණි.

(ඈ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් “භාණ්ඩාගාර සහ විගණනය - 66 ” යන ආකෘතියේ භාවිතා කරනු ලබන භාණ්ඩ හෙළිදරව් කළ යුතුය. එසේ වුවත්, මෙම සමීක්ණෂණය සඳහා මණ්ඩලය විසින් ඉහත ආකෘතියේ හෙළිදරව් කළ යුතු භාණ්ඩ සහ පොදු 47 ආකෘතියේ හෙළිදරව් කළ යුතු භාණ්ඩ වශයෙන් වෙන් වෙන්ව භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. උදා: ලෙස අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ දීර්ඝ කාලයක් පළුදු වී පැවැති ඩිජිටල් කැමරා 02 ක් භාවිතයේ පවතින උපකරණ ලෙස සලකා භාණ්ඩ සමීක්ෂණයේදී හෙළිදරව් කර තිබුණි.

(ඉ) 2017 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ දක්වා ඇති ලැප්ටොප් පරිගණක වන Head Office – Nelsip වැඩසටහන යටතේ ලබා දී තිබූ පරිගණක 04 ක්, පරිගණක අංශයේ පරිගණක 02 ක් වශයෙන් භාවිතා කරනු ලබන එකතුව ලැප්ටොප් පරිගණක 03 ක් පමණක් විගණන භෞතික පරීක්ෂාවේදී ඉදිරිපත් කර තිබුණි. ඉතිරි පරිගණක 03 (ගණකාධිකාරී සතුව පවතින ලැප්ටොප් පරිගණකය ඇතුළුව) විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) 2017 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ දක්වා තිබූ ආකාරයට ලීටර් 1000 වතුර ටැංකි 04 ක් දක්නට ඇති බව සඳහන් කර තිබුණි. එසේ වුවත්, විගණන පරීක්ෂාවේදී මේවා හෙළිදරව් කර නොතිබුණි.

(උ) 2017 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ යතුරු පැදි (TVS BBU – 2636, Bajaj UE – 5492) දක්වා ඇති නමුත් යතුරු පැදි 02 ම කිසිදු අනුමැතියකින් තොරව ගණකාධිකාරී විසින් UE – 5492 හා ක්ෂේත්‍රයේ වාහන නැවතුම්පොළ කුලී ආදායම් එකතු කිරීම සඳහා TVS BBU – 3626 ද භාවිතා කර තිබුණි.

(ඌ) නගර සභාවට අයත් ඇතැම් භාණ්ඩ පෞද්ගලික පාර්ශවය දක්නට ලැබුණි. ඒවා නම්,

1. Suzuki 40 Hrs Power Engine – 01
2. Yamaha 40 Hrs Power Engine – 01
3. Yamaha 15 Hrs Power Engine – 01
4. Sucker Water Pump (submersible pumb) - 01

(එ) නගර සභාවට අයත් මලකඩ බැඳී ඇති Ferry සහ Boat ආදිය වැව් ඉවුරේ භාවිතයකින් තොරව දක්නට ලැබුණි.

(ඒ) වාහන නවතා තිබෙන ස්ථානයේ ට්‍රැක්ටර් යන්ත්‍රයේ ට්‍රේලර් 05 ක් අධික ලෙස පළුදු වූ තත්ත්වයෙන් දක්නට ලැබුණි. මේවා අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට හෝ කටයුතු කර නොතිබුණි.

**3.7 අරපිරිමැසුම් නොවූ ගනුදෙනු**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වීථි විදුලි පහන් මිලදී ගැනීම සහ නිකුත් කිරීම

---------------------------------------------------

(i) මහජනතාව විසින් ගෞරව සභිකයින්ගෙන් සිදුකරනු ලැබූ ඉල්ලීම්වලට අනුකූලව බෙදාහැරීම් සිදුකර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 75(1) ට අනුව රජයේ දෙපාර්තමේන්තුවලට ලැබෙන තොග අයිතමයන් හා ඒවා ලද විගසම, භාරගෙන නියමිත ලේඛනවලට ඇතුළත් කර විධිමත් ලෙස බෙදාහැරිය යුතුය. එසේ වුවත්, මෙම පිළිවෙත අනුගමනය කර නොතිබුණි.

(iii) අදාළ කාලපරිච්ඡේදයේ සෑම එකක්ම රු.3,750 ක් වන LED 50W Flood Light (colr) 236 ක් මිලදී ගැනීම සඳහා රු.885,000 ක් වැය කර තිබුණි. එසේ වුවත්, අදාළ 50W Flood Light (colr) එකක් වෙළඳපොලේ රු.2,350 ක් වශයෙන් මිලදී ගත හැකිව තිබුණත්, එක් විදුලි පහනක් සඳහා රු.1,400 ක් වශයෙන් එකතුව රු.330,400 ක් සභාව විසින් වැඩියෙන් ගෙවා තිබුණි.

(iv) අදාල වීථි විදුලි පහන් සඳහා වන වගකීම් සහතිකය ලබාගෙන නොතිබුණි.

(v) අදාළ වීථි විදුලි පහන් භෞතික විගණන පරීක්ෂාවේදී මිලදී ගත් 50W Flood Light (colr) වලින් වීථි විදුලි පහන් 37 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.8 ප්‍රසම්පාදනය**

**3.8.1 ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම නගර සභාව විසින් සම්පත් හා සේවාවන් ක්‍රියාවලිය සඳහා පිළියෙල කළ යුතුය. එසේ වුවත්, සභාව විසින් සම්පත් වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබූ අතර, සේවාවන් සපයා ගැනීම වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේ මූලික ලේඛන, යෝජනාවන්, පළාත් පාලන ආයතනවල වර්ෂ 04 ක සංවර්ධන සැලැසුම්වල යෝජනාවල සඳහන් සේවාවන් ආදිය අනුගමනය නොකර සැලැස්ම සකස් කර තිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂයේදී සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.